වඩාත් උතුම් වනුයේ කවර සලාතයක් දැයි අල්ලාහ්ගේ දූතයාණන්ගෙන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- විමසන ලදී. එතුමා, “කූනූතය දිගු සලාතය“ යැයි පැවසූහ.

ජාබිර් -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. වඩාත් උතුම් වනුයේ කවර
සලාතයක් දැයි අල්ලාහ්ගේ දූතයාණන්ගෙන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- විමසන ලදී.
එතුමා: කූනූතය දිගු සලාතය යැයි පැවසූහ.
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් මුස්ලිම් එය වාර්තා කර ඇත]

වඩාත් උතුම් වනුයේ කවර සලාතයක් දැයි සහාබාවරුන් නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමාගෙන් විමසූහ. මෙම ප්රශ්ණය කුසල් වැඩි ප්රමාණයක් ලබා ගැනීමේ අරමුණින් අසන ලද්දකි. මෙයින් අදහස් කරනුයේ, වඩාත් උතුම් වනුයේ සලාතයේ කවර වර්ගයක් ද? එසේ නැතිනම් වඩාත් උතුම් වනුයේ සලාතයේ කවර ක්රියාවක් ද? යන්නයි. එනම් කියාම් ඉරියව්ව ද රැකූඋ ඉරියව්ව ද එසේ නැතිනම් සුජූද් ඉරියව්වද යන වගයි. එවිට එතුමා එහි දිගු කියාම් සහිත සලාතය වේ යැයි දන්වා සිටියහ.

http://sunnah.global/hadeeth/si/show/3569